ඇල්ල ප්‍රාදේශීය සභාව - 2021
-----------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඇල්ල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය(මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපචිත පදනම මත ගිණුම් තැබීමේදී සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු, කුලී, බලපත්‍ර ගාස්තු සහ වෙනත් ආදායම් වල මුළු බිල්කළ වටිනාකම රු.141,951,035 ක් වෙනත් අයභාර (Other Revenue) ලෙස මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශනයේ සඳහන් කිරීම වෙනුවට මුදල් පදනම මත රැස්කළ මුළු ආදායම වන රු.22,078,164 ක් ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ලැබිය යුතු දෑ රු.119,872,871 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් පිළියෙල කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදුව ඇති බව හා ඉදිරියේදී නිවැරදි කරන බව සඳහන් කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක පැවති රු.1,690,892 ක බැංකු ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබීම හේතුවෙන් ජංගම වත්කම් එම වටිනාකමකින් අඩුවෙන් දැක්වේ. | මෙම මුදල් වත්කම් ලෙස සටහන් කර තැබීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | |

| | |
|---|---|
| (ඇ) භෞතිකව නොපැවති රු. 1,008,000 ක වටිනාකමක් සහිත වූ ජල කර්මාන්තය සඳහා වූ තොගයක් ගිණුම් වලට ගැලපීම් කර තිබීම හේතුවෙන් මෙහෙයුම් අතිරික්තය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි ශේෂය ඉදිරියේදී ගිණුම්ගත කරන බව සඳහන් කර ඇත. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගි ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.49,160,412 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම නොසැසඳීම පිළිගන්නා බව සඳහන් කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 1,817,225 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,932,847 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදල් යොදවා මාර්ග 04 ක් ඉටු කිරීම සඳහා අනුමත සමිති 04 ක් සමඟ රු.215,492 ක මුදලකට සභාව සමඟ ගිවිසුම්වලට එළඹ තිබු අතර,එම එක් එක් ගිවිසුමට අනුව කර්මාන්තවල ප්‍රසාරණ මූට්ටු වැලි හා තාර යොදා පිරවීම,පොළව හැරීම වැනි ඉටු නොකළ වැඩ කොටස් සඳහා කාර්මික නිලධාරිගේ නිර්දේශය මත රු.84,922 ක මුදලක් ගෙවා තිබුණි. | අදාළ කොන්ත්‍රාත් සමිතිය දැනුවත් කර ඉටු නොකළ වැඩ කොටස් සිදුකර දෙන ලෙස උපදෙස් දුන් බව සඳහන් කර ඇත. | කර්මාන්තයේ ඉටු නොකළ වැඩ කොටස් සඳහා ගෙවූ මුදල් නැවත අයකරගත යුතුය. |